# 4 ශ්‍රේණිය

# සිංහල



**නිපුණතාව** :- $R_1$ $W_1$

01. පහත දී ඇති ඒ ඒ අකුරට අදාළ ශබ්දය යෙදෙන වචන පහත කොටුව තුළින් තෝරා ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| පෞද්ගලික | ගෘහණිය | | ශෛලමය | දිනය | සේලය |
| මිහිකත | කූඩය | ගස | දානය | දවස | |
| චෛත්‍යය | රූප | ගායනය | සෙවන | සෑය | |
| කොස්ස | දෑත | බැත | රීප්ප | තෘණ | |
| ගෙදර | වැට | දුර | බීම | බේසම | බෝලය |
| කෞතුකාගාරය | රෝස | දොළ | රුවන් | | |

1. ''අ'' ශබ්දය - ........................................ ........................................
2. ''ආ'' ශබ්දය - ........................................ ........................................
3. ''ඇ'' ශබ්දය - ........................................ ........................................
4. ''ඈ'' ශබ්ධය - ........................................ ........................................
5. ''ඉ'' ශබ්දය - ........................................ ........................................
6. ''ඊ'' ශබ්දය - ........................................ ........................................
7. ''උ'' ශබ්දය - ........................................ ........................................
8. ''ඌ'' ශබ්දය - ........................................ ........................................
9. ''එ'' ශබ්දය - ........................................ ........................................

10. ''**ඒ**'' ශබ්දය - .......................................... ..........................................

11. ''**ඓ**'' ශබ්දය - .......................................... ..........................................

12. ''**ඍ**'' ශබ්දය - .......................................... ..........................................

13. ''**ඔ**'' ශබ්දය - .......................................... ..........................................

14. ''**ඕ**'' ශබ්දය - .......................................... ..........................................

15. ''**ඖ**'' ශබ්දය - .......................................... ..........................................

**නිපුණතාව :-** $R_1$ $W_1$

02. පිල්ලමට ගැළපෙන වචනය සොයා යා කරන්න.

| | | |
|---|---|---|
| 1. | ඇලපිල්ල | රුවල |
| 2. | දික් ඇදපිල්ල | ඖෂධ |
| 3. | කොම්බුව හා ඇලපිල්ල | භාෂාව |
| 4. | කෙටි ඇදපිල්ල | ඵෑණු |
| 5. | දික් කොන් පාපිල්ල | දියණිය |
| 6. | කොම්බුව හා ගයනුකිත්ත | ගෘහය |
| 7. | ගැට ඇලපිල්ල | දොඹ |
| 8. | කොම්බු දෙක | දූෂණය |
| 9. | දික් ඇදපිල්ල | දැහැත් |
| 10. | කෙටි ඉස්පිල්ල | වෛවර්ණ |

**නිපුණතාව :-** $R_1$ $W_1$

**විරාම ලකුණු හඳුනා ගනිමු.**

**තිත** [ . ] - වාක්‍යක් ලිවීමේ දී එම වාක්‍ය අවසන් බව දැනවීමට තිත ( . ) යොදයි. වාක්‍ය කියවීමේ දී තිත ( . ) යෙදුන ස්ථානයන්හි දී විරාමයක් ගෙන කියවිය යුතුය.

❖ **පහත වාක්‍ය සඳහා තිත ( . ) යොදන්න.**

1. අපි ක්‍රීඩා පිටියට යමු
2. ඔවුහු චාරිකාවට අවශ්‍ය දෑ සූදානම් කළහ

**ප්‍රශ්නාර්ථ ලකුණ** [ ? ] - ප්‍රශ්නයක් අසන වාක්‍ය ලිවීමේ දී එම වාක්‍ය අග ප්‍රශ්නාර්ථ ලකුණ යොදයි. එම වාක්‍ය කියවීමේ දී ප්‍රශ්නාර්ථ ලකුණ යෙදුණ ස්ථානයේ නැවතී විරාමයක් ගෙන කියවිය යුතු ය.

❖ **පහත වාක්‍යවලට ප්‍රශ්නාර්ථ ලකුණ යොදන්න.**

1. ඔබ ගෙදරට යන්නේ කොහොම ද
2. එය කරන්නේ කෙසේ ද
3. කවුද ඔබට එන්න කිව්වේ

**කොමාව** [ , ] - වාක්‍යක් අවසන් වීමට පෙර එම වාක්‍ය කියවීමේ දී වාක්‍ය මැද විරාමයක් ලබා ගැනීම සඳහා යොදයි. වාක්‍යක් තුළ එක ළඟ නාම පද කිහිපයක් යෙදෙන විට එම නාම පද වෙන්කර දැක්වීම සඳහා යොදයි. කොමාව යෙදුන ස්ථානවල දී වාක්‍ය කියවීමේ දී විරාමයක් ගෙන කියවිය යුතු ය.

❖ **පහත වාක්‍යවලට සුදුසු තැන්හී කොමාව යොදන්න.**

1. ඔහු නගරයට ගිය විට අම්මා හමු විය.
2. සමන්පිච්ච සේපාලිකා කඩුපුල් යන මල්වර්ග රාත්‍රි කාලයේ පිපෙන මල් වේ.
3. ඔහු කොපමණ උත්සහ කළත් ගසට නැගීමට නොහැකි විය.

**යුගල උඩු කොමා** “ ” - කවුරුන් හෝ කළ ප්‍රකාශයක් හෝ යමකින් උපුටා ගත් දෙයක් විශේෂ කර පෙන්වීම සඳහා යුගල උඩු කොමාව යොදයි.

❖ **පහත වාක්‍යවලට යුගල උඩු කොමා යොදන්න.**

1. පුතා බත් කෑව ද? අම්මා මගෙන් ඇසුවා ය.
2. අපේ ගෙදර එන්න මගේ මිතුරා පැවසුවේ ය.
3. මැහැල්ල නැව් නැග මුවන්තිස්ස කුමාරයාගේ රටට ගොස් රන්කෙදි කුමාරිකාව සමඟ යහළු වූවා ය.

**විස්මයාදි ලකුණු** ! - විස්මයක් දැනවීමට, ප්‍රාර්ථනයක් හැඟවීමට, සතුටක් දැනවීමට, ශක්තියක් හැගවීමට, විස්මයාදි ලකුණ යොදයි.

❖ **පහත දී ඇති වාක්‍ය සඳහා විස්මයාදි ලකුණ සුදුසු තැන් හී යොදන්න.**

1. මොනවා එය සිදු විය නොහැකිය.
2. ඔබට සෙත් වේවා
3. මෙන්න තාත්තා ඇවිත්
4. අහෝ ඔබට බොහෝ වේදනා දැනෙනවා ද?

**සරල වරහන්** ( ) - යම් වාක්‍යක හෝ වචනයක අර්ථය පැහැදිලි කිරීමට මෙන්ම අමතර තොරතුරක් දැක්වීම සඳහා යොදයි.

❖ **පහත වාක්‍ය සඳහා සුදුසු පරිදි සරල වරහන් යොදන්න.**

1. සෙන්කඩගල මහනුවර දළදා මාළිගාව පිහිටා තිබේ.
2. මිනිසා කිරි බී වැඩෙන ක්ෂීරපායි සතෙකි.

**නිපුණතාව** **:-** $R_1$ $W_1$

03. පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු පරිදි විරාම ලකුණු යොදන්න.

1. අපි සැමදා පාසල් යමු
2. ඔබේ ගම කොහෙ ද
3. ඔවුහු ඔරුවට ගොඩ වූහ
4. ඔරුව ඊළඟ තොටුපළ අසල නතර කර අපි පැළ තවාන වෙත ගියෙමු

5. ලැවරියා ලුණු දෙහි ලූනු බැදුම් හරි ම රසට හදලා බෝතල්වලට දමා නගරයට යවනවා

6. මේ මොර සූරන වැස්සේ කොහෙ යන්න ද තාත්තා බාප්පාගෙන් ඇසුවේ ය

7. වවුලා කිරි බී වැඩෙන ක්ෂීරපායී සතෙකු වේ

8. ඔබට බුදු සරණයි

9. අපි දිනුම් ඔහු කීවේ ය

10. විභාගය ජය ගැනීමට නම් ඔබ කුමක් කළ යුතු ද

**නිපුණතාව** :- $S_2$ $R_2$ $W_2$

04. ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිලිතුරු සපයන්න.

කුණාටුවට පසු දින උදෑසන ග්‍රීෂ්ම ඍතුවේ දීප්තිමත් හිරු එළියෙන් පරිසරය ම ආලෝකවත් විය. ගස්වල අතු අග රැඳී තිබූ ජල බිංදු විසිරී ගිය අතර මෙතෙක් වේලා බිම වැතිර සිටි තණකොළ යළි නැඟී සිටියේ ය. ගමේ සිට පැමිණි කරත්තයක් පාරේ ගමන් කරනු දක්නට ලැබිණි. නැමී ගිය කළු අං ඇති මීහරක් දෙදෙනෙක් කරත්තය ඇදගෙන ආහ. කරත්තයේ බෝන් ලීය මත වාඩි වී සතුටින් ගී ගයමින් යන ගැමියෙකි. සිල්ලර කඩ හිමියකු වන හෙතෙම ලුණු සහ අනෙක් ද්‍රව්‍ය මිලට ගැනීමට නගරයට යමින් සිටියේ ය. විශාල ගල පෙරළී තිබූ ස්ථානයට පැමිණි විට ඔහුට නතර වීමට සිදු විය. පාර අවහිර වී ඇත. පාරේ වම් පැත්තේ බෑවුමකි. ඊට පහළින් පෙනෙනුයේ වේගයෙන් ජලය ගලා යන ගඟකි. දකුණු පැත්තේ විශාල

කන්දකි. විශාල ගල දුටු ගැමියා තම බෙල්ල කසමින් කරත්තයෙන් බැස ගල වෙත ගියේ ය. ඔහු එය තල්ලු කිරීමට උත්සාහ කළේ ය. එහෙත් ඔහුට එය සෙලවීමටවත් නොහැක.

1. පරිසරය ආලෝකවත් වූයේ කුමකින් ද? ..........................................................................

2. කරත්තය ඇදගෙන ආවේ කවු ද? ..........................................................................

3. කරත්තයේ ගිය ගැමියා වාඩි වී සිටියේ කුමක් මත ද?

..........................................................................................................................

4. කරත්තය ගමන් කළ පාර අවහිර වී තිබුණේ ඇයි?

..........................................................................................................................

5. ''වැතිර සිටි'' යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

..........................................................................................................................

6. ගැමියා නගරයට යන්නේ කුමක් මිල දී ගන්න ද?

..........................................................................................................................

7. ඉහත ඡේදයෙන් සඤ්ඤක අකුරක් යෙදී ඇති වචන 3 ක් සොයා ලියන්න.

........................................ ........................................ ........................................

**නිපුණතාව** **:-** $L_5$ $S_5$ $R_5$ $W_5$

05. පහත දී ඇති වචනවලට හිස්තැනට ගැළපෙන අක්ෂරය වරහන් තුළින් තෝරා ලියන්න.

1. ඖ .......... ධ (ෂ / ශ)
2. අනු .......... වය (බ / භ)
3. භා .......... ඩ (න් / ණ්)
4. වි .......... මය (ෂ් / ස් / ශ්)
5. වෙ .......... ඤාම (ළ / ල)
6. වෘක් .......... ය (ශ / ෂ)
7. ප්‍රදේ .......... ය (ස / ශ / ෂ)
8. නුව .......... (න / ණ)

06. දී ඇති තේරවිලි තෝරන්න. (තුන් තේරවිලි)

1. ගොහුරු වේල්ල :- ..................................................................................................

..........................................................................................................................

2. ගජනාලය :- ..................................................................................................

..........................................................................................................................

07. තේරවිලි කවිවල හිස්තැන් පුරවන්න.

1. ටිං ටිං ගාන්නා ලේනා නොවේ දෝ

..........................................................................................

..........................................................................................

..........................................................................................

2. ඉනේ තිබෙන ලිය හැඹිලිය නොවේ දෝ

..........................................................................................

..........................................................................................

..........................................................................................

08. හිස්තැනට ගැලපෙන සමානාර්ථ පදය තෝරා ලියන්න.

1. තාත්තා - ....................................  6. ප්‍රවෘත්ති - ....................................

2. පාසල - ....................................  7. ඇස - ....................................

3. තරු - ....................................  8. හිස - ....................................

4. දූපත - ....................................  9. රාත්‍රිය - ....................................

5. අහස - ....................................  10. පාර - ....................................

**(නෙත, රැය, දිවයින, පියා, ගුවන, විදුහල, තාරකා, පුවත්, ඔළුව, මාර්ගය)**

09. ගැළපෙන සමානාර්ථ පදය සොයා යා කරන්න.

උදෑසන  කකුළ

කුරුල්ලා  ජලය

පාදය  ග්‍රන්ථය

වතුර  හිමිදිරිය

පොත  පක්ෂියා

10. එක් එක් හිස්තැනට ගැළපෙන විරුද්ධාර්ථ පදය වරහන් තුළින් තෝරා ලියන්න.

| | |
|---|---|
| 1. ඉදිරිපස - ...................................... | 6. ගැළපෙන - .................................... |
| 2. පිපෙනවා- ...................................... | 7. පුරුදු - ...................................... |
| 3. යහපත් - ...................................... | 8. සුදුසු - ...................................... |
| 4. ලස්සන - ...................................... | 9. දිරන - ...................................... |
| 5. ආරම්භය- ...................................... | 10. සෙමෙන් - ...................................... |

**(අවලස්සන, වේගයෙන්, නොදිරන, නොගැළපෙන, නුපුරුදු, පරවෙනවා, පිටුපස, අවසානය, නුසුදුසු, අයහපත්)**

11. දී ඇති යුගල පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. අවුරුද්දට සෑම දෙනාම පාහේ ................................................................ අනුගමනය කරයි.
2. ......................................................... ගම්වැසියන් සමඟ සමගියෙන් කටයුතු කළ යුතු ය.
3. කුඩා දරුවෝ ............................................................. ලැබීමෙන් සතුටට පත් වෙති.
4. ''රාත්‍රී කාලයේ ......................................................................... යාම නුසුදුසුයි.'' සීයා කීව්වේ ය.
5. ............................................................... පිරිසිදුවට තබා ගැනීම අපගේ වගකීමකි.
6. ආහාර නිෂ්පාදනයට ......................................................... සියල්ල වගා කිරීම ඉතා වැදගත්ය.

7. අපි අධ්‍යාපන කටයුතුවලට බාධා නොවන ලෙස ........................................... කරමු.

8. ඉතා පිරිසිදු .................................................. ගැනීමෙන් නිරෝගී ජීවිතයක් ගත කළ හැකිය.

**(ගෙවල් දොරවල්, කෙළි සෙල්ලම්, තෑගී බෝග, කෑම බීම, වතු පිටි, ගමන් බිමන්, අහල පහල, සිරිත් විරිත්)**

12. දී ඇති ප්‍රස්තාව පිරුළෙහි අර්ථය වරහන් තුළින් තෝරා ලියා, ශබ්ද නඟා කියවන්න.

1. කළුවා මාරපන් ගියා වගේ.

...........................................................................................................................

2. ආණ්ඩිහත්දෙනාගේ කැඳ හැළිය වගේ.

...........................................................................................................................

3. කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වගේ.

...........................................................................................................................

4. ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ.

...........................................................................................................................

5. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ.

...........................................................................................................................

**(නුසුදුස්සාට තනතුරු / වරප්‍රසාද දීමෙන් අහංකාර වීම, විමසීමෙන් තොරව යමක් කිරීම, අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම, තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණ ගැනීම, යම් අපහසුතාවයකින් හෝ කරදරයකින් මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් වඩාත් කරදරයකට හා අපහසුතාවයකට පත් වීම)**

13. ඉඟි වැකි මඟින් අප ප්‍රකාශ කිරීමට යන අදහසට වඩා පැහැදිලිවත්, රසවත් ලෙසත් ඉදිරිපත් කළ හැකිය. එමෙන්ම ඉඟි වැකියේ මතුපිට අර්ථය ඉක්මවා යන අර්ථයක් ලබා දෙයි. දී ඇති ඉඟිවැකිවල අර්ථය වරහන් තුළින් තෝරා ලියන්න.

1. එක හුස්මට

.......................................................................................................................

2. අකුරක් නෑර

.......................................................................................................................

3. ඉහේ මලක් පිපුණා

.......................................................................................................................

4. අනූ නවයෙන් බේරුණා

.......................................................................................................................

5. මොර සූරන වැස්ස

.......................................................................................................................

**(දැඩි සතුටකට පත් වීම, අධික වර්ෂාව, යම් කිසි කාර්යක් අවසන්වන තුරු නොනවත්වා කිරීම, යම් විපතකින් යාන්තමින් ගැළවීම, කිසිවක් අත නොහැර කියවීම සහ කතා කිරීම)**

14. දී ඇති සුබ පැතුම් පත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිලිතුරු සපයන්න.

**විභාගයට සුබ පැතුම්**

**2022 වර්ෂයේ ශිෂ්‍යත්ව**
**විභාගයට පෙනී සිටින**
**නෙතුකි අමන්දා**
**අක්කාට විශිෂ්ට ජයක්**
**ලබන්නට ප්‍රාර්ථනා**
**කරමි.**

**හතරවන ශ්‍රේණියේ**

**ගිත්ම මල්ලී**

1. මෙම සුබ පැතුම් පත කුමක් සඳහා ද?

   ..............................................................................................................................

2. සුබ පැතුම එක් කරන්නේ කවුරුන් සඳහා ද?

   ..............................................................................................................................

3. මෙහි සඳහන් විභාගය පැවැත්වෙන්නේ කුමන වර්ෂයේ ද?

   ..............................................................................................................................

4. මෙම සුබ පැතුම එක් කරන්නේ කවු ද?

   ..............................................................................................................................

5. මෙහි ඇති ඒක වචන ක්‍රියාපදයක් ලියන්න.

   ..............................................................................................................................

15. පහත දී ඇත්තේ පෞද්ගලික ලිපියක ආකෘති පත්‍රයකි. වරහන් තුළින් පිළිතුර තෝරා එය සම්පූර්ණ කරන්න.

1. ............................................

2. ............................................

3. ............................................

4. ............................................

5. ...................................................................

...................................................................................

6. ..............................

**(කරුණු ලිවීම, දිනය, අවසානය, ආමන්ත්‍රණය, ආශිර්වාදය, ස්ථානය)**

16. පහත ආකෘතිය තුළ ඔබ කැමති අයෙකුට පෞද්ගලික ලිපියක් ලියන්න.

.............................................................

.............................................................

.......................................................................................

.............................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

.............................................................

**නිපුණතාව** **:-** $L_7$ $S_7$ $R_7$ $W_7$

17. සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවක් ලෙස රබාන හඳුන්වා දිය හැකිය. දී ඇති රබන් පද සම්පූර්ණ කරන්න.

1. රන් රඹුටන් ගස් ........................................ යට

   ගිනි කුකුලන් ................................ දෙන යි

   උන්ට කන්න ........................................ දෙන විට

   උනුන් එක්ක ............................................ ලස්සනයි

2. අපේ ගෙදර තුන් දෙන යි

   ...........................................................................................

   පහල ගෙදර තුන් දෙන යි

   තුන් පොළේ ම .................................................... යි

3. වචන හුරුයි - දොංතා

   ...........................................................................................

   ...........................................................................................

   ...........................................................................................

**නිපුණතාව** **:-** $L_7$ $S_7$ $R_7$ $W_7$

18. දී ඇති එක් එක් මාතෘකාවට ගැලපෙන වාක්‍ය තුන බැගින් ලියන්න.

- ජලය අපට සම්පතකි.

1. ..........................................................................................................................

..........................................................................................................................

2. ..........................................................................................................................

..........................................................................................................................

3. ..........................................................................................................................

..........................................................................................................................

- පරිසරය ආරක්ෂා කරමු.

1. ..........................................................................................................................

..........................................................................................................................

2. ..........................................................................................................................

..........................................................................................................................

3. ..........................................................................................................................

..........................................................................................................................

**නිපුණතාව** **:-** $W_{10}$

19. කොටුව තුළ දී ඇති නාම පද අදාළ වෘත්තය තුළ ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| ගිරවා | රෝගියා | බස් නැවතුම්පොළ | පූසා | පන්සල |
| බෑගය | පොත | කේතලය | අත්තම්මා | |
| මිදුල | කිඹුලා | ආලින්දය | ලේනා | |
| පැන්සල | | | | |
| පාසල | අම්මා | ලියුම් මාමා | | |

**පුද්ගල නාම**

1. ............................................
2. ............................................
3. ............................................
4. ............................................

**සත්ත්ව නාම**

1. ............................................
2. ............................................
3. ............................................
4. ............................................

**ද්‍රව්‍ය නාම**

5. ............................................
6. ............................................
7. ............................................
8. ............................................

**ස්ථාන නාම**

1. ............................................
2. ............................................
3. ............................................
4. ............................................

**නිපුණතාව** **:-** $W_{10}$

20. දී ඇති නාම පද අප්‍රාණවාචී හා ප්‍රාණවාචී නාම පද ලෙස වගුගත කරන්න.

කඩය, නංගි, අඹ, ලේනා, කුරුල්ලෝ, යහළුවා, තේක්ක, කූඩය, ආච්චි,

පිඟාන, ගවුම, කඩදාසි, මිදුල, අසල්වැසියෝ

| **ප්‍රාණවාචී නාම පද** | **අප්‍රාණවාචී නාම පද** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

**නිපුණතාව :-** $W_{10}$

21. දී ඇති පුරුෂලිංග පදයට ගැළපෙන ස්ත්‍රී ලිංග පදය සොයා යා කරන්න.

| | |
|---|---|
| මිතුරා | නිළිය |
| සිංහයා | කොටි දෙන |
| නළුවා | සහෝදරිය |
| යහළුවා | සිංහ ධේනුව |
| කොටියා | යෙහෙළිය |
| ඇතා | කිරිල්ලි |
| සහෝදරයා | මිතුරිය |
| කුරුල්ලා | ඇතින්න |

**නිපුණතාව :-** $W_{10}$

22. එක් දෙයක් පිළිබඳ හැඟවෙන පද ඒක වචන පද ලෙසත්, එකකට වඩා වැඩි ප්‍රමාණයක් පිළිබඳව අදහස දෙන පද බහු වචන පද ලෙසත් හඳුන්වයි. දී ඇති ඒක වචන පදයට අදාළ බහුවචන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. මම - ....................................
2. උදැල්ල - ....................................
3. ගවයා - ....................................
4. පේළිය - ....................................
5. කුඹුර - ....................................
6. කණ්ඩායම - ....................................
7. ගුරුවරයා - ....................................
8. රට - ....................................
9. ලේඛකයා - ....................................
10. තාත්තා - ....................................

**(පේළි, ගුරුවරු, කුඹුරු, අපි, උදලු, කණ්ඩායම්, රටවල්, තාත්තලා, ලේඛකයෝ, ගවයෝ)**

**නිපුණතාව :-** $W_{10}$

23. ඉබේ සිදුවන දෙයක් හෝ කවුරුන් හෝ කරන දෙයක් ක්‍රියාවක් වේ. ඒවා හැඳින්වීමට භාවිත කරන පද ක්‍රියා පද ලෙස හඳුන්වයි.

- වරහන් තුළ දී ඇති ක්‍රියාපද වගුගත කරන්න.

**(දුවයි, නටයි, පායයි, බොයි, ලියයි, පිපෙයි, දැනෙයි, යති, පාවෙයි, දමයි, පරවෙයි, වැටෙයි)**

| ඉබේ සිදුවන ක්‍රියා පද | කවුරුන් හෝ සිදු කරන ක්‍රියා පද |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |

**නිපුණතාව :-** $W_{10}$

24. වර්තමාන කාල වාක්‍ය යනු සිදුවෙමින් පවතින ක්‍රියාවක් පිළිබඳ හෝ යමෙකු විසින් යමක් කරමින් පවතින බව හැඟවෙන වාක්‍යය යි. පහත කොටුව තුළ දී ඇති ක්‍රියා පද අතරින් වර්තමාන කාල ක්‍රියා පද තෝරා රවුම් කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| දුවයි | රඟයි | පිපෙනවා | පරවෙයි | පියඹති |
| නැටුවේ ය | යමි | පීනමු | ගියහ | ගයති |
| කියවමි | පැමිණුණේ ය | පවසති | | |

**නිපුණතාව :-** $W_{10}$

## අප්‍රාණවාචී ඒක වචන හා බහු වචන යෙදුණු වර්තමාන කාල වාක්‍ය

❖ කිසියම් වර්තමාන කාල වාක්‍යයක උක්ත පදය ලෙස අප්‍රාණවාචී ඒකවචන නාම පදයක් හෝ අප්‍රාණවාචී බහුවචන පදයක් යෙදෙන විට ක්‍රියා පදය ''යි'' අකුරෙන් අවසන් වේ.

උදා :-

1. මල උදෑසනට පිපෙනවා.

- මල උදෑසන පිපෙයි.

(ඉහත උදාහරණය දෙස බලන විට පැහැදිලි වන්නේ ''මල උදෑසනට පිපෙයි.'' යන වාක්‍ය තුළ ''මල'' යන අප්‍රාණවාචී ඒකවචන නාම පදය යි. එය වාක්‍යයේ උක්ත පදය ලෙස යෙදෙන විට ක්‍රියා පදය ''පිපෙයි'' ලෙස ''යි'' අකුර යෙදී අවසන් වී ඇති බවයි.

25. පහත කතා කරන බසින් දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

1. කොළය සුළඟේ පාවෙනවා.

- .......................................................................................................................

2. සිසිල් සුළඟක් හමනවා.

- .......................................................................................................................

3. පිච්ච මල බිමට වැටෙනවා.

- .......................................................................................................................

4. මල සවසට පරවෙනවා.

- .......................................................................................................................

5. ගඟ පහළට ගලනවා.

- .......................................................................................................................

පහත වාක්‍ය දෙස අවධානය යොමු කරන්න.

උදා :-

මල් උද්‍යානයට පිපෙනවා.

මල් උද්‍යාන පිපෙයි.

(ඉහත ''මල් උද්‍යානට පිපෙයි.'' යන වාක්‍ය තුළ අප්‍රාණවාචී බහු වචන පදයක් ලෙස ''මල්'' යන උක්ත නාම පදය යෙදී ක්‍රියා පදය ''පිපෙයි'' යනුවෙන් ''යි'' යෙදී අවසන්ව ඇත.)

**නිපුණතාව** **:-** $W_{10}$

26. පහත කතා කරන බසින් දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

1. වළාකුළු අහසේ පායනවා.

- ..........................................................................................................................

2. කොළ සුළඟේ පාවෙනවා.

- ..........................................................................................................................

3. අඹ ගෙඩි බිමට වැටෙනවා.

- ..........................................................................................................................

4. අවුරුදු කාලයට ගස් කොළ පාටින් හැඩවෙනවා.

- ..........................................................................................................................

5. තරු රාත්‍රියට පායනවා.

- ..........................................................................................................................

## ප්‍රාණවාචී ඒකවචන හා බහු වචන යෙදුණු වර්තමාන කාල වාක්‍ය

❖ ප්‍රාණවාචී ඒකවචන නාම පදයක් වර්තමාන කාල වාක්‍යයක උක්ත නාම පදය ලෙස යෙදෙන විට ක්‍රියා පදය ''යි'' අකුරෙන් අවසන් වේ.

උදා :-

නංගී පාසලට යනවා. (කථන බස)

නංගී පාසලට යයි. (ලිඛිත බස)

(ඉහත ''නංගී පාසලට යයි'' යන වාක්‍ය තුළ ප්‍රාණවාචී ඒක වචන නාම පදයක් ලෙස ''නංගී'' යන උක්ත නාම පදය යෙදී ක්‍රියා පදය ''යයි'' යනුවෙන් ''යි'' යෙදී අවසන්ව ඇත.)

27. කථන බසින් දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

1. මල්ලී මුහුණ සෝදනවා.
- ..............................................................................................................
2. ඔහු ඇඳුම් අදිනවා.
- ..............................................................................................................
3. අම්මා බත් උයනවා.
- ..............................................................................................................
4. ඇය රසකැවිලි සාදනවා.
- ..............................................................................................................
5. තාත්තා රූපවාහිනිය නරඹනවා.
- ..............................................................................................................

6. තේජාන් ගීතයක් ගයනවා.

- ..........................................................................................................................

7. ඔහු පිරිසුදු ඇඳුම් අඳිනවා.

- ..........................................................................................................................

8. විහඟී දිනපතා පාසල් යනවා.

- ..........................................................................................................................

9. ඈ සෑම ඉරිදම දහම් පාසලට එනවා.

- ..........................................................................................................................

10.කුරුල්ලා අහසේ පියාඹනවා.

- ..........................................................................................................................

❖ ප්‍රාණවාචී බහු වචන නාම පදයක් වර්තමාන කාල වාක්‍යයක උක්ත පදය ලෙස යෙදෙන විට ක්‍රියා පදය ''ති'' අකුරෙන් අවසන් වේ.

උදා :-

මිනිස්සු කුඹුර කොටනවා. (කථන බස)

මිනිස්සු කුඹුර කොටති. (ලිඛිත බස)

28. පහත කථන බසින් දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

1. මල්ලිලා සෙල්ලම් කරනවා.

- ..........................................................................................................................

2. අම්මලා බත් උයනවා.

- ..........................................................................................................................

3. අයියලා නගරයට යනවා.

- ........................................................................................................................

4. කුරුල්ලෝ අහසේ පියාඹනවා.

- ........................................................................................................................

5. වෛද්‍යවරු රෝගීන්ට ප්‍රතිකාර කරනවා.

- ........................................................................................................................

6. ඔවුහු අපට කරුණාව දක්වනවා.

- ........................................................................................................................

7. ළමයි දිනපතා පාසල් යනවා.

- ........................................................................................................................

8. ඔවුහු ක්‍රීඩා පිටියේ සෙල්ලම් කරනවා.

- ........................................................................................................................

9. ගුරුවරු අපට හොඳ නරක කියා දෙනවා.

- ........................................................................................................................

10.වන සත්තු රාත්‍රී කාලයට ගම්වදිනවා.

- ........................................................................................................................

## මම , අපි යෙදුණු වර්තමාන කාල වාක්‍ය.

❖ වර්තමාන කාල වාක්‍යයක උක්ත නාම පදය ලෙස ''මම'' යෙදුණු විට ක්‍රියා පදය ''මි' අකුරෙන් අවසන් වේ.

❖ වර්තමාන කාල වාක්‍යයක උක්ත නාම පදය ලෙස ''අපි''යෙදුණු විට ක්‍රියා පදය ''මු'' අකුරෙන් අවසන් වේ.

උදා :-

මම පාසලට යනවා. (කථන බස)
මම පාසලට යමි. (ලිඛිත බස)

අපි පාසලට යනවා. (කථන බස)
අපි පාසලට යමු. (ලිඛිත බස)

29. කථන බසින් දී ඇති ක්‍රියා පද වරහන් තුළින් තෝරා ලිඛිත බසින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. යනවා | - ............................ | 6. කරනවා | - ............................ |
| 2. සෝදනවා | - ............................ | 7. නටනවා | - ............................ |
| 3. ලියනවා | - ............................ | 8. පිහිනනවා | - ............................ |
| 4. බොනවා | - ............................ | 9. කඩනවා | - ............................ |
| 5. දුවනවා | - ............................ | 10.නැගිටිනවා | - ............................ |

(නැගිටිමු , නටමි , කරමු , ලියමු , යමි , සෝදමි , කඩමු , පිහිනමි , බොමු , දුවමි)

**නිපුණතාව** :- $W_{10}$

30. දී ඇති වාක්‍ය ලිඛිත බසින් ලියන්න.

1. මම පාඩම් කරනවා.

.............................................................................................................................

2. මම රෙදි සෝදනවා.

.............................................................................................................................

3. මම වේගයෙන් දුවනවා.

.........................................................................................................................................

4. මම නගරයට යනවා.

.........................................................................................................................................

5. මම වැවේ පිහිනනවා.

.........................................................................................................................................

6. අපි උදෑසනම නැගිටිනවා.

.........................................................................................................................................

7. අපි සෙල්ලම් කරනවා.

.........................................................................................................................................

8. අපි රචනා ලියනවා.

.........................................................................................................................................

9. අපි මල් කඩනවා.

.........................................................................................................................................

10. අපි වතුර බොනවා.

.........................................................................................................................................

**නිපුණතාව** **:-** $W_{10}$

31. හිස්තැනට සුදුසු වර්තමාන කාල ක්‍රියාපදය වරහන් තුළින් තෝරන්න.

1. කන්ද උඩින් හිරු ........................................... (පායති / පායයි / පායමු)

2. කුරුල්ලෝ කෑම සොයා ........................................... (යති / යයි / ගියේ ය)

3. අම්මා එළවළු කූඩයට ........................................... (දමති / දමයි / දැමූහ)

4. වසු පැටවා සෙල්ලම් ................................................ (කරයි / කරති / කළහ)

5. සිසිල් සුළඟක් ............................................... (හමති / හැමූහ / හමයි)

**නිපුණතාව** **:-** $W_{10}$

32. දී ඇති වාක්‍යයේ හිස්තැනට සුදුසු ක්‍රියාපද වරහන් තුළින් තෝරා ලියන්න.

1. උදේට නෙලුම් මල ...................................................
2. කන්ද උඩින් ඉර ...................................................
3. වැහි බින්දු පොළවට ඇඳ ...................................................
4. ගස් සුලඟට ...................................................
5. තාත්තා නගරයට ...................................................
6. ක්‍රිඩකයෝ වතුර ...................................................
7. ඇත්තු පෙරහැර අලංකාර ...................................................
8. මනුජ වේගයෙන් ...................................................
9. ගුරුවරු සිසුන්ට උපදෙස් ...................................................
10. ලේඛකයා පොත ...................................................

**(සෙලවෙයි , කරති , බොති , දෙති , වැටෙයි , පිපෙයි , යයි, කියවයි, දුවයි , පායයි)**

**නිපුණතාව** :- $W_{10}$

33. වාක්‍යයට ගැළපෙන ක්‍රියාපදය තෝරා යා කරන්න.

| | |
|---|---|
| 1. ඌ වතුර | අඬියි |
| 2. ඔහු පාරේ වේගයෙන් | කියවයි. |
| 3. ඇය පොත් | වෙති. |
| 4. ඔවුහු තරඟයට සහභාගී | පදවයි. |
| 5. ඈ ලස්සන චිත්‍රයක් | යමු. |
| 6. අපි පන්සල් | බොයි. |
| 7. ඔවුහු නාට්‍යයක් | ගමන් කරයි. |
| 8. රියදුරා ප්‍රවේශමෙන් වාහනය | බුරති. |
| 9. මම මුහුණ | දෙයි. |
| 10. බල්ලෝ රෑට | යමි. |
| 11. ඌ නිවස ආරක්ෂා කර | නරඹති. |
| 12. මම නගරයට | සෝදමි. |

**නිපුණතාව :-** $W_{10}$

34. පහත වර්තමාන කාල ක්‍රියාපදයට ගැලපෙන අතීත කාල ක්‍රියා පදය සොයා යා කරන්න. (කථන භාෂාව)

| <u>වර්තමාන කාල</u> | <u>අතීත කාල</u> |
|---|---|
| 1. සෝදනවා | නෑවා |
| 2. පිහිනනවා | කෑවා |
| 3. දුවනවා | සේදුවා |
| 4. ලියනවා | ගැයුවා |
| 5. කනවා | ඇන්දා |
| 6. බලනවා | බිව්වා |
| 7. නානවා | ලිව්වා |
| 8. ගයනවා | දිව්වා |
| 9. අඳිනවා | පිහිනුවා |
| 10. බොනවා | බැලුවා |

**නිපුණතාව :-** $W_{10}$

## අතීත කාල වාක්‍ය හඳුනා ගනිමු.

❖ අතීත කාල වාක්‍යයක අප්‍රාණවාචී ඒක වචන නාමපදයක් හෝ බහු වචන නාම පදයක් උක්තපදය ලෙස යෙදෙන විට ක්‍රියාපදය ''ඒය'' ශබ්දයෙන් අවසන් වේ.

උදා :-

මල උදෑසනට පිපුණා. <u>මල</u> උදෑසන <u>පිපුණේ ය.</u>

මල් උදෑසනට පිපුණා. <u>මල්</u> උදෑසනට <u>පිපුණේ ය.</u>

35. පහත දී ඇති වාක්‍ය නිවැරදි ක්‍රියා පදය සොයා යා කරන්න.

| | |
|---|---|
| 1. ඉර උදේට | සෙළවුණේ ය. |
| 2. තරු රාත්‍රියට | ගමන් කළේ ය. |
| 3. ගස සුළඟට | බැස ගියේ ය. |
| 4. පෑන බිමට | පාවුණේ ය. |
| 5. ගඟ පහළට | පෑව්වේ ය. |
| 6. කොළය සුළඟේ | පරවුණේ ය. |
| 7. වළාකුළු අහසේ | බැබළුණේ ය. |
| 8. මල සවසට | ගිලුණේ ය. |
| 9. ඉර සවසට | ගැලුවේ ය. |
| 10. යකඩ ඇණය ජලයේ | වැටුණේ ය. |

**නිපුණතාව :-** $W_{10}$

36. කථන බසින් දී ඇති ක්‍රියා පදය ලිඛිත බසින් ලියන්න.

1. ගියා - ..................................
2. කෑවා - ..................................
3. ලිව්වා - ..................................
4. ආවා - ..................................
5. දැක්කා - ..................................
6. ගත්තා - ..................................

**(දැක්කේ ය / ගත්තේ ය / ගියේ ය / කෑවේ ය / ආවේ ය / ලිව්වේ ය)**

අතීත කාල ක්‍රියා පද ආකාර 02 කි.

1. ඒක වචන ක්‍රියා පද
2. බහු වචන ක්‍රියා පද

ඒක වචන ක්‍රියාපදයක් “ඒය” සහ “ආය” ශබ්දයෙන් අවසන් වේ.

උදා :- කළා - කළේ ය (ඒය ශබ්දය)

කළා - කළා ය (ආය ශබ්දය)



**නිපුණතාව :-** $W_{10}$

37. වරහන් තුළින් නිවැරදි ක්‍රියා පදය තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. තාත්තා කුඹුරට ......................................................................
2. මල්ලී මුහුණ ......................................................................
3. මාමා ගෙදර ......................................................................
4. සීයා පැළයක් ......................................................................
5. තේජාන් කතන්දරයක් ......................................................................
6. පූසා කිරි ......................................................................

7. ගිත්ම වේගයෙන් .................................................................

8. අලියා ගස්වල අතු කඩා .................................................................

9. ඔහු ගීතයක් .................................................................

10. ඔහු චිත්‍රයක් .................................................................

**(ගැයුවේ ය , ගියේ ය , කිවුවේ ය , දිව්වේ ය , සේදුවේ ය , බිවුවේ ය , ආවේ ය , ඇන්දේ ය , සිටෙවුවේ ය , කෑවේ ය)**

අතීත කාල එක වචන ක්‍රියා පදය භාවිතයේ දී ස්ත්‍රී ලිංග නාමපදයක් වාක්‍යයක යෙදෙන විට ක්‍රියා පදය "ආය" යන ශබ්දයෙන් අවසන් වේ.

උදා :- නංගී මල් කැඩුවා ය.

ක්‍රීඩිකාව වේගයෙන් දිව්වා ය.



**නිපුණතාව :-** $W_{10}$

38. කථන බසින් දී ඇති ක්‍රියා පද ලිඛිත බසට හරවා ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. ගියා | - ගියා ය | 4. ආවා | - ................................ |
| 2. කෑවා | - ................................ | 5. දැක්කා | - ................................ |
| 3. ලිව්වා | - ................................ | 6. ගත්තා | - ................................ |

**(ලිව්වා ය / ගත්තා ය / ආවා ය / ගියා ය / කෑවා ය / දැක්කා ය)**

අතීත කාල එක වචන ක්‍රියා පදය භාවිතයේ දී පුරුෂ ලිංග නාමපදයක් වාක්‍යයක යෙදෙන විට ක්‍රියා පදය "එය" යන ශබ්දයෙන් අවසන් වේ.

උදා :- මල්ලී සෙල්ලම් කළේ ය.

කුරුල්ලා අහසේ පියැඹුවේ ය.



**නිපුණතාව :-** $W_{10}$

39. දී ඇති වාක්‍යවල හිස්තැන් වරහන් තුළින් පිලිතුරු තෝරා සම්පූර්ණ කරන්න.

1. නංගී ගමට ..................................................................
2. අම්මා බත් ..................................................................
3. ඈ රසකැවිලි ..................................................................
4. නැන්දා කතන්දර ..................................................................
5. අක්කා ගෙදර ..................................................................
6. විහඟී රචනයක් ..................................................................
7. ඈය චිත්‍රපටය ..................................................................
8. කිරිල්ලී අහසේ ..................................................................
9. මුව දෙන පැටියාට කිරි ..................................................................
10. ආච්චි වතුර ..................................................................

**( ලිව්වා ය , කෑවා ය , කිව්වා ය , බිව්වා ය, පියෑඹුවා ය , නැරඹුවා ය , ආවා ය , සෑදුවාය , ගියා ය , දුන්නා ය)**

**නිපුණතාව :-** $W_{10}$

40. පහත අතීත කාල ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග ඒකවචන ක්‍රියාපද නිවැරදි තීරුවට තෝරා ලියන්න.

| **ස්ත්‍රී ලිංග ඒකවචන ක්‍රියා පද (අතීත කාල)** | **පුරුෂ ලිංග ඒකවචන ක්‍රියාපද (අතීත කාල)** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

**(දිව්වා ය / ලිව්වේ ය / නෑවා ය / දිව්වේ ය / සේදුවා ය / ලිව්වා ය / කෑවේ ය / නැටුවේ ය / සේදුවේ ය / නැටුවා ය)**

**නිපුණතාව :-** $W_{10}$

41. පහත ක්‍රියා පදවල ඒක වචන ක්‍රියා පදය සොයා යටින් ඉරක් අඳින්න.

1. කළෝය / කළා ය
2. බැලුවා ය / බැලූහ
3. ගියේ ය / ගියෝ ය
4. නැටුවෝ ය / නැටුවා ය
5. සේදූහ / සේදුවා ය

බහු වචන ක්‍රියාපදයක් “ඕය” සහ “හ” ශබ්දයෙන් අවසන් වේ.

උදා :- ගියා - ගියෝ ය (ඕය ශබ්දය)
ගියා - ගියහ (හ ශබ්දය)



**නිපුණතාව** **:-** $W_{10}$

42. පහත ක්‍රියාපදවල බහු වචන ක්‍රියා පදය සොයා යටින් ඉරක අඳින්න.

1. ගියා ය / ගියෝ ය
2. කෑවෝ ය / කෑවේ ය
3. ලිවූහ. / ලිව්වා ය
4. නැටුවෝ ය / නැටුවේ ය
5. දැක්කා ය / දැක්කෝ ය

**නිපුණතාව** **:-** $W_{10}$

43. දී ඇති ක්‍රියා පදයට අදාළ අතීත කාල බහුවචන ක්‍රියා පදය වරහන තුළින් තෝරා ලියන්න.

1. ලිව්වා ය - ........................................ 4. කෑවේ ය - ........................................
2. නැටුවා ය - ........................................ 5. කැඩුවේ ය - ........................................
3. දිව්වේ ය - ........................................

**(දිව්වෝ ය / නැටූහ / ලිවූහ / කෑවෝ ය / කැඩුවෝ ය)**

**නිපුණතාව** **:-** $W_{10}$

44. වරහන් තුළින් තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. ළමයි ගීත ......................................................
2. අම්මලා කෑම ......................................................
3. වෛද්‍යවරු රෝගීන්ට ප්‍රතිකාර ......................................................

4. සිංහයෝ ගර්ජනා .....................................................

5. අලි ගමට .....................................................

6. තාත්තලා කුඹුර .....................................................

7. ඔවුහු ශ්‍රමදානයට .....................................................

8. මුව රැළ තණ කොළ .....................................................

9. ගුරුවරු අපට හොඳ නරක කියා .....................................................

10. දෙමපියෝ තම දරුවන්ට කෑම .....................................................

**(ආවෝ ය , පිසුවෝ ය , සහභාගී වූහ , කෑහ , කළෝ ය , කැවූහ , කෙටූහ , දැක්වූහ , දුන්හ , ගැයුවෝ ය)**

**නිපුණතාව :-** $W_{10}$

## *මම සහ අපි යෙදුණු අතීත කාල වාක්‍ය*

❖ අතීත කාල වාක්‍යක උක්ත පදය ලෙස මම යෙදුණු විට ක්‍රියා පදය ''මි'' අකුරෙන් අවසන් වේ.

උදා :-

මම පාසලට යමි. (වර්තමාන කාල වාක්‍ය)

<u>මම</u> පාසලට <u>ගියෙමි.</u> (අතීත කාල වාක්‍ය)

45. දී ඇති වර්තමාන කාල ක්‍රියා පදයට ගැළපෙන අතීත කාල ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. යමි - ...........................   2. සෝදමි - ...........................

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. | දුවමි | - ........................... | 7. | නටමි | - ........................... |
| 4. | පිහිනමි | - ........................... | 8. | අදිමි | - ........................... |
| 5. | ලියමි | - ........................... | 9. | කියවමි | - ........................... |
| 6. | ගයමි | - ........................... | 10. | දල්වමි | - ........................... |

**(නැටුවෙමි , පිහිණුවෙමි , ගියෙමි , දිව්වෙමි , දැල්වුවෙමි , ඇන්දෙමි , කියෙවුවෙමි , ගැයුවෙමි , ලිව්වෙමි , සේදුවෙමි)**

**නිපුණතාව :-** $W_{10}$

46. පහත දී ඇති වර්තමාන කාල වාක්‍යයට ගැළපෙන අතීත කාල වාක්‍ය ලියන්න.

1. මම ගමට යමි.

උදා :- මම ගමට ගියෙමි.

2. මම මුහුණ සෝදමි.

.......................................................................................................................

3. මම වේගයෙන් දුවමි.

.......................................................................................................................

4. මම වැවේ පිහිනමි.

.......................................................................................................................

5. මම ලිපියක් ලියමි.

.......................................................................................................................

6. මම ගීතයක් ගයමි.

.......................................................................................................................

7. මම තාලයට නටමි.

.................................................................................................................................

8. මම ලස්සන චිත්‍රයක් අඳිමි.

.................................................................................................................................

9. මම කතන්දර පොතක් කියවමි.

.................................................................................................................................

10. මම පහන දල්වමි.

.................................................................................................................................

**නිපුණතාව** **:-** $W_{10}$

❖ අතීත කාල වාක්‍යක උක්ත පදය ලෙස ''අපි'' යෙදෙනු විට ක්‍රියා පදය ''මු'' අකුරෙන් අවසන් වේ.

උදා :-

අපි ගමට යමු. (වර්තමාන කාල වාක්‍ය)

අපි ගමට ගියෙමු. (අතීත කාල වාක්‍ය)

47. දී ඇති වර්තමාන කාල ක්‍රියා පදයට ගැළපෙන අතීත කාල ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. යමු - ............................ 5. ලියමු - ............................

2. සෝදමු - ............................ 6. ගයමු - ............................

3. දුවමු - ............................ 7. නටමු - ............................

4. පිහිනමු - ............................ 8. අඳිමු - ............................

9. කියවමු - ...........................    10. දල්වමු - ...........................

**(නැටුවෙමු , පිහිණුවෙමු , ගියෙමු , දිව්වෙමු , දැල්වුවෙමු , ඇන්දෙමු , කියෙව්වෙමු , ගැයුවෙමු , ලිව්වෙමු , සේදුවෙමු)**

**නිපුණතාව :-** $W_{10}$

48. පහත දී ඇති වර්තමාන කාල වාක්‍යයට ගැළපෙන අතීත කාල වාක්‍ය ලියන්න.

1. අපි කුඹුරට යමු.

   ..........................................................................................................

2. අපි අත් සෝදමු.

   ..........................................................................................................

3. අපි වේගයෙන් දුවමු.

   ..........................................................................................................

4. අපි වැවේ පිහිනමු.

   ..........................................................................................................

5. අපි ලිපි ලියමු.

   ..........................................................................................................

6. අපි ගීත ගයමු.

   ..........................................................................................................

7. අපි තාලයට නටමු.

   ..........................................................................................................

8. අපි ලස්සන චිත්‍ර අඳිමු.

   ..........................................................................................................

9. අපි කතන්දර පොත් කියවමු.

.......................................................................................................................................

10. අපි වෙසක් පොහොයට පහන් කූඩු දල්වමු.

.......................................................................................................................................

**නිපුණතාව** **:-** $W_{10}$

49. දී ඇති ක්‍රියා පද නිවැරදිව තෝරා වගුව සම්පූර්ණ කරන්න.

කෑවා ය / බලයි / නැටූහ / කති / දුවති / සේදුවෝ ය / බැලුවා ය /

නටයි / සෝදති / දිව්වේ ය

| **වර්තමාන කාල ක්‍රියා පද** | **අතීත කාල ක්‍රියා පද** |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

**නිපුණතාව** **:-** $W_{10}$

50. හිස්තැනට ගැළපෙන ක්‍රියාපදය තෝරන්න.

1. ගසකින් ගෙඩියක් බිමට ...................................................... (වැටෙයි / වැටෙති)

2. මල් සවසට ........................................................ (පරවෙති / පරවෙයි)

3. නංගි වතුර ........................................................ (බොති / බොයි)

4. අයියා ගසට ............................................................ (නගියි / නඟිති)

5. නිමල් සහ අනුර පාඩම් .................................................. (කරයි / කරති)

6. තාත්තලා දරුවන්ට ආදරය .................................................... (කරති / කරයි)

7. මම නගරයට ................................................ (යමි / යමු)

8. අක්කා ද අයියා ද මට අවවාද .................................................. (දෙයි / දෙති)

9. නංගී පාසල් ................................................................ (ගියා ය / ගියේ ය)

10. අම්මා සහ තාත්තා අපට රැකවරණය ..................................................................

(සැලසුවෝ ය / සැලසුවේ ය)

11. මම කෑම .......................................................... (කෑවෙමු / කෑවෙමි)

12. ඔවුහු අපට අවවාද ...................................................... (දුන්නෝ ය / දුන්නේ ය)

13. නයනා කඩයට ...................................................... (ගියේ ය / ගියා ය)

14. අමර ගුරුවරුන්ගේ උපදෙස් ..................................................................

(පිළිගත්තා ය / පිළිගත්තේ ය)

15. උඹ කැලයට වේගයෙන් .................................................... (දුවයි / දුවති)

16. ඔහු මට ......................................................... (බනියි / බනිති)

17. කුරුල්ලා අහසේ ............................................ (පියඹයි / පියඹති)

18. උණට කැලෑව මැද දී තවත් යහළුවෙකු ...........................................................

(හමුවුණේ ය / හමුවුණා ය)

19. ඔහු පලතුරු ........................................................... (ගත්තා ය / ගත්තේ ය)

20. කුරුල්ලෝ උදෑසනම ආහාර සොයා ...............................................

(ගියේ ය / ගියෝ ය)

21. මම සහ නයන බත් ............................................... (කෑවේය / කෑවෙමු)

22. මම ගීතයට සවන් ........................................................... (දුන්නෙමි / දුන්නේ ය)

23. අපි අතරමඟදී .................................................. (හමු වූහ / හමු වුණොමු)

24. ගඟ වේගයෙන් පහළට ............................................... (ගැලුවේ ය/ ගැලුවා ය)

25. රණවිරුවෝ යුද්ධය ජය .................................................. (ගත්තේ ය / ගත්හ)

**නිපුණතාව** :- $W_{10}$

51. වර්තමාන කාල වාක්‍ය අතීත කාල වාක්‍යවලට හරවා හිස්තැන මත ලියන්න.

1. ගස සුළඟට පෙරළෙයි.

   ...................................................................................................................

2. මල් සවසට පරවෙයි.

   ...................................................................................................................

3. ගොවියා කුඹුර කොටයි.

   ...................................................................................................................

4. ඔහු නගරයට යයි.

.............................................................................................................................

5. තරු රාත්‍රී අහසේ බබළයි.

.............................................................................................................................

6. සඳ රාත්‍රී අහස ආලෝකමත් කරයි.

.............................................................................................................................

7. අම්මා රසවත් කෑමක් සාදයි.

.............................................................................................................................

8. උෟ වේගයෙන් දුවයි.

.............................................................................................................................

9. ඔහු දෙමාපියන්ට හොඳින් සලකයි.

.............................................................................................................................

10. මම පාසල් යමි.

.............................................................................................................................

11. ගුරුවරු ළමයින්ට අධ්‍යාපනය දෙයි.

.............................................................................................................................

12. දෙමව්පියෝ දරුවන්ට ආදරය කරති.

.............................................................................................................................

13. මුව දෙන පැටවුන්ට කිරි දෙයි.

.............................................................................................................................

14. අක්කලා තාලයට ගීත ගයති.

.............................................................................................................................

15. පුංචි මට අවවාද දෙයි.

.......................................................................................................................

16. ඇය උණුසුම් කෝපි බොයි.

.......................................................................................................................

17. අපි පාසල් යමු.

.......................................................................................................................

18. රාත්‍රියට කණාමැදිරියෝ පියඹති.

.......................................................................................................................

19. මම ක්‍රීඩා කරමි.

.......................................................................................................................

20. නංගි පිරිසිදු කරයි.

.......................................................................................................................

21. අපි තාලයට සංගීත භාණ්ඩ වාදනය කරමු.

.......................................................................................................................

**නිපුණතාව :-** $W_{10}$

52. දී ඇති වචනයට ගැලපෙන අක්ෂරය වරහන් තුළින් තෝරන්න.

1. පර .......... (න / ණ)
2. සාධාර .......... (න / ණ)
3. අ .......... රාධපුර (නු / ණු)
4. ඇ .......... මි ( ඳු / ඥු)
5. ර .......... විරුවා (ණ / න)
6. හොර .......... ව (ණෑ / නෑ)

7. කොළ .......... (බ / ඹ)

8. ව .......... ඳ (ළ / ල)

9. ළ .......... (ඟ / ග)

10. සම .......... (ග / ඟ)

11. ආස .......... ය (ණ / න)

12. අත් .......... න (ශ / ස)

13. ස .......... සනවා (න/ණ)

14. ප්‍රදර් .......... න (ෂ / ස / ශ)

15. විකාශ .......... ය (ණ / න)

16. සංදර් .......... න ( ෂ / ස / ශ)

17. ලක්ෂ .......... (ණ / න)

18. තාක් .......... ණ (ෂ /ශ / ස)

19. ග .......... වැටිය (ළ් / ල්)

20. පෙනු .......... ය (ණෝ / නේ)

**නිපුණතාව** **:-** $W_{10}$

53. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රළ නොනඟින වේලෙහි හිරු රැසින් බැබළෙන නිල්මිණි තලාවක් වැනි මුහුද කුඩා අපගේ සිත්හි වුව ද චමත්කාරයත්, භයත් ඇති කළේය. එහි සුන්දරත්වය නිසා චමත්කාරය ද, එහි ගැඹුර, විශාලත්වය, මුහුදෙන් එතෙර පිටසක්වල ය කියන වැඩිහිටියන්ගේ බස, යන ආදිය නිසා භය ද අප තුළ හට ගත්තේ ය. බා දිය කාලයෙහි ගල්පරෙහි වළවල දිවෙන විවිධ වර්ණයෙන් බැබළෙන මත්ස්‍යයන් ද, ගල්මල් ද, රන්වන් පාටින් බැබළෙන පෙඳ ද, කකුළුවන් ද, අත ගැසූ විගස හකුළාගන්නා මල් පොකුරු වැනි අඬු පඬු පොකුරු සහිත තුඩු ඇති මූදු කූඩැල්ලන් ද, ඉකිරියන් ද බලමින් ඇවිද්ද කාලය, සුරංගනා කථාවකින් ඇසූ අපූර්ව වස්තූන් සැබැවින් දුටු කාලයක් ලෙස තවමත් සිහි කළ හැකි ය.

(අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ)

1. ඡේදයේ සඳහන් දන්තජ ''න'' යෙදෙන වචනයක් ලියන්න.

..............................................................................................................................

2. ''මූර්ධජ ණ'' යෙදුන වචනයක් ලියන්න. ..................................................................

3. ''දන්තජ ල'' යෙදුන වචන දෙකක් ලියන්න.

.......................................................... ..........................................................

4. ''මූර්ධජ ළ'' යෙදුන වචනයක් ඡේදය ඇසුරින් ලියන්න.

..................................................................................................................................................

5. ''තාලුජ ශ'' යෙදෙන වචනයක් සොයා ලියන්න. ....................................................

6. ඡේදයේ ඇති සඤ්ඤක අකුරු යෙදුන වචන දෙකක් ලියන්න.

.......................................................... ..........................................................

7. ඔබ කැමති ''මූර්ධජ ෂ'' යෙදුන වචනයක් ලියන්න.

..................................................................................................................................................

**නිපුණතාව :-** $W_{10}$

54. පහතින් දී ඇති අල්පප්‍රාණ අක්ෂරවලට අදාළවන මහප්‍රාණ අක්ෂරය ඊට ඉදිරියෙන් ඇති හිස්තැන මත ලියන්න.

1. ක - ..........................
2. ච - ..........................
3. ට - ..........................
4. ත - ..........................
5. ප - ..........................
6. ග - ..........................
7. ජ - ..........................
8. ඩ - ..........................
9. ද - ..........................
10. බ - ..........................